සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ඉස්ලාම් ශිෂ්ටාචාරය I
இஸ்லாமிய நாகரிகம் I
Islamic Civilization I

47 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** ඉස්ලාම් ශිෂ්ටාචාරයේ විශේෂාංග අතුරෙන් 'වසතියියා' යනු
(1) ගෝලීය වේ. (2) පූර්ණත්වය වූවකි. (3) මධ්‍යස්ථ වූවකි.
(4) මිශ්‍රිත නොවීමයි. (5) යථාර්ථවාදී ය.

**2.** "ශිෂ්ටාචාරය යනු එක ජන වර්ගයක නැත්නම් කණ්ඩායමක ගති ලක්ෂණ වේ" යන මතය ඉදිරිපත් කළ විද්වතා වනුයේ,
(1) අමීර් හසන් සිද්දීක් (රහ්) ය. (2) ඉමාම් ගස්සාලි (රහ්) ය.
(3) ඉමාම් ඉබ්නු තෛමියියා (රහ්) ය. (4) මුහම්මද් අබ්දුහු (රහ්) ය.
(5) ඉබ්නු කල්දූන් (රහ්) ය.

**3.** අල්-කුර්ආන් පහළ කළ ක්‍රමය හා එහි ඓතිහාසික පසුබිම ආදිය පැහැදිලි කරන කලාව වන්නේ,
(1) ඉල්මුල් හදීස් ය. (2) ඉල්මුල් අකීදා ය.
(3) ඉල්මුත් තසව්වුෆ් ය. (4) ඉල්මුත් තෆ්සීර් ය.
(5) ඉල්මුල් මීරාස් ය.

**4.** ජාහිලියියා සමයේ නගර නිර්මාණ කිරීමේ දී අරාබිවරුන් තම එක් එක් ගෝත්‍රිකයින්ට වෙන් කරගත් භූමි කොටස
(1) කබීලා ලෙස හැඳින්වේ. (2) අසබා ලෙස හැඳින්වේ.
(3) හයිමා ලෙස හැඳින්වේ. (4) මජන්නා ලෙස හැඳින්වේ.
(5) කදීආ ලෙස හැඳින්වේ.

**5.** "මිනිස් වර්ගයාගේ සියලු ම ක්‍රියාවන්ට සාරධර්මානුකූල පදනම ආගම වේ" යන මතය ඉදිරිපත් කළ තැනැත්තා
(1) ඇරිස්ටෝටල් ය. (2) ගාන්ධි ය. (3) සිසරෝ ය. (4) කොන්ෆියුෂියස් ය. (5) ප්ලේටෝ ය.

**6.** පහත කරුණු සලකන්න.

A - ඉජ්තිහාද්වලට ඉඩදෙයි.
B - මිනිස් චින්තනයට මුළුමනින් ම අවස්ථාව ලබා දේ.
C - නීතිවලට අදාළ අරමුණු ඉදිරිපත් කෙරේ.
D - පෙර තිබූ වේදයන්ගේ නීති අනුමත කෙරේ.
E - වෙනස් වන හා වෙනස් නොවන න්‍යායන් කෙරෙහි අවධානය යොමු කෙරේ.

ඉහත කරුණුවලින් නීති සම්පාදනයේ දී අල්-කුර්ආන් මගපෙන්වීමෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ පමණක් ඇතුළත් වරණය වන්නේ,
(1) A, B හා D ය. (2) A, B හා E ය. (3) A, C හා D ය. (4) A, C හා E ය. (5) A, D හා E ය.

**7.** තනි හා ද්විත්ව තිත්වලින් තොර ඍජු රේඛා සහ කෝණයන් ආදිය ඇතුළත් අරාබි අක්ෂර හැඩයන් වන්නේ,
(1) කූෆි ය. (2) අර්රිකා ය. (3) තව්කි ය. (4) නස්තලික් ය. (5) නස්කු ය.

**8.** කූෆෙ ඉබ්නු කිලාබ් නමැත්තා තම පරිපාලන කටයුතු ඉටු කිරීමට පිහිටුවාගත් සභාව වන්නේ,
(1) දාරුල් හික්මා ය. (2) දාරුල් ඊමාන් ය. (3) දාරුල් අර්කම් ය.
(4) දාරුන් නද්වා ය. (5) දාරුස් සලාම් ය.

[දෙවැනි පිටුව බලන්න.

**9.** තර්තීබුන් නුසූල් සහ තර්තීබුත් තිලාවත් යන පදවලින් පිළිවෙළින් දැක්වෙන්නේ,
(1) පාරායනය කරන පිළිවෙළ හා පහළ කළ පිළිවෙළ වේ.
(2) පහළ කළ පිළිවෙළ සහ සංග්‍රහ කරන ලද පිළිවෙළ වේ.
(3) සංග්‍රහ කළ පිළිවෙළ සහ පහළ කළ පිළිවෙළ වේ.
(4) පහළ කළ පිළිවෙළ සහ ආරක්ෂා කළ පිළිවෙළ වේ.
(5) පහළ කළ පිළිවෙළ සහ පාරායනය කරන පිළිවෙළ වේ.

**10.** 'අල්හාවි' ලෙස ප්‍රසිද්ධියට පත් වෛද්‍ය ග්‍රන්ථයේ කර්තෘ වන්නේ,
(1) අලි ඉබ්නු සීනා ය. (2) එඩ්වර්ඩ් ජෙන්නර්ගේ ය.
(3) අබු බක්ර් සකරියියා අර්රාසි ය. (4) කැම්ස්ටන් ය.
(5) ගැලන් ය.

**11.** මහාචාර්ය සී.ඒ. නල්ලිනෝ විසින් නබි (සල්) තුමා පිළිබඳ සඳහන් කරන ලද අදහස වන්නේ,
(1) ඔහු ආධ්‍යාත්මිකතාව පමණක් ඉගැන්වී ය යන්න ය.
(2) ඔහු සමකාලීනව ආගම සහ රාජ්‍යය ගොඩනැගී ය යන්න ය.
(3) ඔහු රජයක් බිහිකිරීම ඉලක්ක කරගෙන සිටියේ ය යන්න ය.
(4) ඔහු වෙළඳ සමාජයක් බිහිකිරීම ඉලක්ක කරගෙන සිටියේ ය යන්න ය.
(5) ඔහු වහලුන් නිදහස් කරගැනීමේ අරගලයට ප්‍රමුඛතාවය දුන්නේ ය යන්න ය.

**12.** "ආගමෙහි බලකිරීමක් නැත" යන අල්-කුර්ආන් වදන හඟවන නිවැරදි අදහස වන්නේ,
(1) ආගමික නිදහසට ඉඩදෙයි යන්න ය.
(2) ආගමික පක්ෂපාතිත්වයෙන් තොර පිළිවෙතට මගපාදයි යන්න ය.
(3) ආගමික විශ්වාසයන් වෙනස්වන සුළුයි යන්න ය.
(4) අනෙක් ආගම්වල විශ්වාසයන් පිළිබඳ ව විවාද කිරීමට අනුබල දෙයි යන්න ය.
(5) කාලය හා පරිසරයට අනුව ආගම අත්හැර දැමීමට ඉඩ දෙයි යන්න ය.

**13.** පහත කරුණු සලකන්න.

A - වහී අවසන් නොවී තිබීම
B - හාෆිල්වරු අඩුවෙන් දක්නට තිබීම
C - නබි (සල්) තුමා ජීවතුන් අතර සිටීම
D - එකලස් කිරීමට අනුමැතිය නොතිබීම
E - එකලස් කිරීමට සම්පත් නොතිබීම

ඉහත කරුණුවලින් නබි (සල්) තුමාගේ සමයේ අල්-කුර්ආන් ග්‍රන්ථකරණය **සිදු නොවීමට** හේතු වූ ප්‍රධාන කරුණු ලෙස සැලකෙන පිළිතුර ඇති වරණය වනුයේ,
(1) A, B හා D වේ. (2) A, B හා E වේ. (3) A, C හා D වේ. (4) B, C හා E වේ. (5) B, D හා E වේ.

**14.** 'ඉජ්මාඋස් සුකූත්' යන්නට වඩාත් නිවැරදි අර්ථකථනය වන්නේ,
(1) සහාබිවරයකු විසින් ඉදිරිපත් කරන අදහස ප්‍රතික්ෂේප කිරීම වේ.
(2) ඉමාම්වරුන්ගේ ඒකමතික අදහස් වේ.
(3) සහාබිවරයකු ඉදිරිපත් කළ මතය ජනයා අතර ප්‍රසිද්ධියට පත් වී, කිසිදු විරෝධතාවයක් නොතිබීම වේ.
(4) තත්කාලීන ෂරීආ ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ ඒකමතික අදහස වේ.
(5) ජනයාගේ ඒකමතික තීරණය වේ.

● **15** සිට **17** දක්වා සෑම ප්‍රශ්නයක් ම **X, Y** තීරු යටතේ තොරතුරු දී ඇත. **Y** තීරුවේ ඇති දේ **X** තීරුවේ ඇති දේ සමග කිසියම් හෝ ආකාරයකින් සම්බන්ධ වී ඇත. එහෙත් ඒවා අපිළිවෙළින් පවතියි. **X** තීරුවේ ඇති තොරතුරට ගැළපෙන පරිදි **Y** තීරුවේ ඇති තොරතුරු ගළපා පිළිවෙළට සකස් කොට නිවැරදි ගැළපුම තෝරන්න.

**15.**

| X | Y |
|---|---|
| (i) පත්තේපූර් සීග්රි | A - කුතුබ්දීන් අයිබෙග් |
| (ii) කුව්වතුල් ඉස්ලාම් මස්ජිද් | B - ෂාජහාන් රජු |
| (iii) බානත් සුආද් | C - අබ්බාසි සමයේ බලකොටුව |
| (iv) දිල්ලි ජාමිආ මස්ජිද් | D - අක්බර් රජු |
| (v) කස්රුල් සහබ් | E - සුහෙල් කවියා |

(1) A, E, B, C, D (2) B, D, A, C, E (3) C, B, A, E, D (4) D, A, E, B, C (5) E, B, A, C, D

[තුන්වැනි පිටුව බලන්න.

**16.**

| X | Y |
|---|---|
| (i) මහාවංශය | A - යෝනස් |
| (ii) යවන | B - W. ගයිගර් |
| (iii) සංදේශ සාහිත්‍යය | C - 2 වන බුවනෙකබාහු |
| (iv) කුරුණෑගල රාජධානිය | D - ඉබ්නු බතූතා |
| (v) ශ්‍රී පාද කන්ද | E - යොන්ලිය |

(1) A, D, E, B, C (2) B, A, E, C, D (3) C, B, D, A, E (4) D, A, E, C, B (5) E, B, D, A, C

**17.**

| X | Y |
|---|---|
| (i) කස්නවි | A - ඊජිප්තුව |
| (ii) තුලූනි | B - කුරාෂාන් |
| (iii) බුවෛහිද් | C - ඇෆ්ගනිස්ථානය |
| (iv) සෙල්ජුක් | D - බැග්ඩෑඩ් |
| (v) අයියූබි | E - තෛලම් |

(1) A, D, C, B, E (2) B, E, C, D, A (3) C, A, E, B, D (4) D, B, A, E, C (5) E, C, A, D, B.

**18.** කලීෆා උමර් (රලි) තුමාගේ පාලනය යටතේ ප්‍රාදේශීය ආණ්ඩුකාරවරයා ලෙස පත්කරන ලද තැනැත්තා කුමන නමකින් හැඳින්වූයේ ද?
(1) වලි (2) නාඉබ් (3) කාති (4) ඉමාම් (5) අමීර්

**19.** ඊජිප්තු ශිෂ්ටාචාරය හා සම්බන්ධ වූ ගංගාව ඇතුළත් වරණය වන්නේ,
(1) යුප්‍රටීස් ය. (2) කොංගෝ ය. (3) ටයිග්‍රීස් ය. (4) සින්ද් ය. (5) නයිල් ය.

**20.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - අල්-කුර්ආන් වචනවලින් ම අල්-කුර්ආන් වචන පැහැදිලි කිරීම
B - ඉජ්තිහාද් මගින් පැහැදිලි කිරීම
C - සුන්නා ආධාරයෙන් පැහැදිලි කිරීම
D - වැඩිහිටි නබි සගයන්ගෙන් අසා පැහැදිලි කිරීම

ඉහත කරුණුවලින් නබිතුමාගේ සගයින් අල්-කුර්ආනය අර්ථදැක්වීමට අනුගමනය කළ ක්‍රමවේදයන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) A, C, D, B (2) B, D, C, A (3) C, B, A, D (4) D, A, C, B (5) D, B, C, A

- ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා සම්බන්ධ වූ පහත සඳහන් කරුණු සලකා **21** සිට **25** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ලේකම්
B - කාලිද් බින් බකායා
C - මහා පරාක්‍රමබාහු
D - අන්දරංග දුරේ
E - ෂේක් අබ්දුල් කාදර් ආලිම්
F - තාගූර්
G - වයඹ ලංකාවේ රාජධානි
H - අබූ උස්මාන්
I - 2 වන බුවනෙකබාහු
J - ෆුතුහුල් බුල්දාන්
K - ඉබ්නු බතූතා

**21.** ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය සඳහන් වන ග්‍රන්ථ වන්නේ,
(1) B හා C ය. (2) D හා E ය. (3) E හා G ය. (4) G හා J ය. (5) I හා J ය.

**22.** ශ්‍රී ලංකාවේ රජවරුන්ගේ පාලන සමයේ මුස්ලිම්වරුන් දැරූ තනතුරු වන්නේ,
(1) A හා D ය. (2) B හා F ය. (3) E හා I ය. (4) F හා H ය. (5) I හා J ය.

**23.** ශ්‍රී ලංකාවේ මුල් කාලීන මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා සම්බන්ධ වන අරාබිවරුන් වන්නේ,
(1) A හා C ය. (2) B හා K ය. (3) C හා H ය. (4) D හා F ය. (5) E හා H ය.

**24.** රජවරුන්ගේ පාලන සමයේ විදේශ සබඳතාවලට සම්බන්ධ වූ මුස්ලිම් ප්‍රධානීන් වන්නේ,
(1) B හා E ය. (2) D හා I ය. (3) E හා F ය. (4) E හා H ය. (5) F හා J ය.

**25.** දේශීය ආර්ථික සංවර්ධනයට මුස්ලිම්වරුන්ගේ දායකත්වය නිවැරදිව භාවිත කළ රජවරුන් වන්නේ,
(1) A හා D ය. (2) B හා C ය. (3) C හා I ය. (4) E හා F ය. (5) F හා I ය.

**26.** බෙතුල් මුකද්දස් පිහිටි ප්‍රදේශය මුදවාගත් කොමාන්ඩර්වරුන්ගෙන් කෙනෙකු වනුයේ,
(1) මුහම්මද් බින් කාසිම් ය. (2) තාරික් බින් සියාද් ය.
(3) අහ්මද් සිද්දිල්ලි ය. (4) හජ්ජාජ් බින් යූසුෆ් ය.
(5) සලාහුද්දීන් අයියූබි ය.

**27.** පහත කරුණු සලකන්න.
A - ලිවීමට හා කියවීමට හැකියාවක් නොතිබීම
B - කාව්‍ය සාහිත්‍යය වර්ධනය වීම
C - ලේඛන සම්ප්‍රදායන් සහ ලිඛිත ලේඛන හිඟවීම
D - විශාල ප්‍රමාණයක් කවි එකලස් කොට තිබීම
E - ස්වරාත්මක කාව්‍ය රටා තිබීම
ඉහත කරුණුවලින් ජාහිලියියා සමයේ කාව්‍ය සාහිත්‍යය වර්ධනය වීමට හේතු වූ කරුණු වන්නේ,
(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, B හා E ය. (4) A, C හා E ය. (5) B, D හා E ය.

**28.** මාදුරු ඔයෙන් සොයාගත් ගංවතුර සීමා කිරීම සඳහා වූ කඩදොර (sluice gate) පරීක්ෂා කළ විට එය පහත සඳහන් කුමන ප්‍රදේශවලට අයත් බව සොයාගනු ලැබුවේ ද?
(1) ඊජිප්තුව, මෙසපොතේමියා, උතුරු අරාබියාව
(2) උතුරු අරාබියාව, ඊජිප්තුව, සින්ද්
(3) චීනය, මෙසපොතේමියාව, ඊජිප්තුව
(4) සින්ද්, මෙසපොතේමියාව, උතුරු අරාබියාව
(5) සින්ද්, චීනය, උතුරු අරාබියාව

**29.** නබි (සල්) තුමාගේ ලිපිය ශ්‍රී ලංකා රජු වෙත භාරදීමට පැමිණි තානාපතිවරයා වන්නේ,
(1) අම්ර් බින් ආස් (රලි) ය. (2) තමීම් අල්-අන්සාරි (රලි) ය.
(3) මුස්අබ් බින් උමෛර් (රලි) ය. (4) වහ්බ් ඉබ්නු අබි කබ්සා (රලි) ය.
(5) මුආද් බින් ජබල් (රලි) ය.

**30.** ඉස්ලාමයට පෙර අරාබියාවේ ලිවීමට හා කියවීමට නොදත් අය හැඳින්වූයේ,
(1) හර්බියියූන් ලෙස ය. (2) කුත්තාබූන් ලෙස ය.
(3) උම්මියියූන් ලෙස ය. (4) මුවහ්හිදූන් ලෙස ය.
(5) මජූසියියූන් ලෙස ය.

**31.** **X** තීරුවේ ඇතැම් මුජද්දිද්වරුන්ගේ නම් සහ **Y** තීරුවේ ඔවුන් හා සම්බන්ධ වන කරුණු අපිළිවෙළින් සඳහන් වේ.

| X | Y |
|---|---|
| (i) මව්ලානා ඉල්යාස් (රහ්) | A - තෆ්හීමුල් කුර්ආන් |
| (ii) මව්ලානා මව්දූදි (රහ්) | B - ෆත්හුර් රබ්බානි |
| (iii) ඉමාම් මුහම්මද් බින් අබ්දුල් වහ්හාබ් (රහ්) | C - ජමාඅත් තබ්ලීක් |
| (iv) අබුල් හසන් අලි නද්වි (රහ්) | D - තව්හීද් |
| (v) ශේක් අබ්දුල් කාදිර් ජීලානි (රහ්) | E - නද්වතුල් උලමා |

**X** තීරුවට ගැළපෙන පරිදි **Y** තීරුවේ ඇති දේ ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.
(1) A, D, C, B, E (2) B, A, E, D, C (3) C, A, D, E, B (4) D, A, B, E, C (5) E, A, C, B, D

**32.** **X** හා **Y** තීරුවල තොරතුරු කිහිපයක් දී ඇත. **Y** තීරුවේ ඇති දේ **X** තීරුවේ ඇති දේ සමග කිසියම් සම්බන්ධතාවයක් පවතී. එහෙත් ඒවා අපිළිවෙළින් දක්නට ඇත.

| X | Y |
|---|---|
| (i) ඉස්නා අෂරියියා | A - වාක්‍යයක් තවත් වාක්‍යයක් වෙනස් කිරීමේ තත්ත්වය |
| (ii) අස්මාඋර් රිජාල් | B - ෂරිආහි සියලු ක්ෂේත්‍රයන් ඇතුළත්ව ගන්නා ලද තීරණය |
| (iii) ඉජ්තිහාද් කුල්ලි | C - හදීස් දැනුම් දෙන්නන් හා අනුපිළිවෙළ පිළිබඳ විස්තරය |
| (iv) තක්ලීද් | D - තමන්ගේ මග පෙන්වන්නන් ලෙස ඉමාම්වරුන් 12 දෙනකු පමණක් නිර්ණය කරගත් අය |
| (v) අන් නාසික් වල් මන්සූක් | E - ආගමික කටයුතු අධ්‍යයනයකින් තොරව අනුගමනය කිරීම |

**X** තීරුවට ගැළපෙන පරිදි **Y** තීරුවේ ඇති කරුණු අනුපිළිවෙළින් සකස්කොට ඇති නිවැරදි වරණය තෝරන්න.

(1) A, C, B, E, D (2) B, A, D, E, C (3) C, B, A, E, D (4) D, C, B, E, A (5) E, B, A, D, C

**33.** තජ්දීද් යනු
(1) අපිළිවෙළින් ඇති දේ නැවත සැකසීම වේ.
(2) භාවිතයේ ඇති නීතියක් ඉවත්කොට නව නීතියක් නිර්මාණය කිරීම වේ.
(3) ආගම වෙනස් කිරීම සඳහා වූ ප්‍රයත්නයකි.
(4) ආගමකට නව දේවල් ඇතුළත් කිරීම වේ.
(5) මතභේදයන් ඇති කිරීම වේ.

**34.** 'නබි දාවූද් (අලෛ) තුමාගේ සමාජයේ බටනලාවන්ගෙන් කෙනෙක්' ලෙස වර්ණනා කරන ලද සහාබි වන්නේ,
(1) බිලාල් බින් රවාහා (රළි) ය. (2) අබූ මූසා අල් අෂ්අරි (රළි) ය.
(3) සෙඅද් බින් සාබිත් (රළි) ය. (4) උස්මාන් බින් අෆ්ෆාන් (රළි) ය.
(5) අබ්දුල්ලාහ් බින් මස්හූද් (රළි) ය.

**35.** ඉමාම් ගස්සාලි (රහ්) විසින් රචනා කරන ලද ග්‍රන්ථ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(1) අල්ෆතාවා හා අල් අස්මාඋ වස්සිෆාත් ය.
(2) ෆත්හුර් රබ්බානි හා ගුන්යතුත් තාලිබීන් ය.
(3) සකාෆතුල් පලාසිෆා හා මුන්කිද් මිනල් ළලාල් ය.
(4) කිතාබුල් උම්මු හා උම්තතුස් සාලික් ය.
(5) තෆ්සීර් ඉබ්නු කසීර් හා තෆ්සීර් කුර්ආනිල් අළීම් ය.

**36.** මෝගල් අධිරාජ්‍යයේ අක්බර් රජු විසින් ආගම පිළිබඳව දැරූ වැරදි මතයට විරුද්ධව හඬ නැගූ චින්තකයා වන්නේ,
(1) අල්ලාමා ඉක්බාල් (රහ්) ය. (2) ෂිබ්ලි නුඃමානි (රහ්) ය.
(3) අෂ්රෆ් අලි දානවි (රහ්) ය. (4) ෂාහ් වලියුල්ලාහ් තිහ්ලවි (රහ්) ය.
(5) ෂේහ් අහ්මද් සිර්හින්දි (රහ්) ය.

**37.** 19 වන ශතවර්ෂයේ, සමාජ විද්‍යා චින්තනය තේමා කොටගෙන බිහිවූ තෆ්සීර් ග්‍රන්ථය වන්නේ,
(1) අල්-ජලාලයින් ය. (2) අල්-බයිලාවි ය. (3) අල් කුර්තුබි ය.
(4) අල්-මනාර් ය. (5) අල්-ආලූසි ය.

**38.** ඉස්ලාම් ලෝකයේ සුප්‍රසිද්ධ වූ අලෙක්සැන්ඩ්‍රියා සහ ජාමියා මිල්ලියියා යන විශ්වවිද්‍යාල පිහිටි රටවල් පිළිවෙළින්,
(1) ඊජිප්තුව හා ඉන්දියාව වේ. (2) ඉරානය හා ස්පාඤ්ඤය වේ.
(3) ස්පාඤ්ඤය හා ඉන්දියාව වේ. (4) ටියුනීසියාව හා ඉන්දියාව වේ.
(5) ඊජිප්තුව හා තුර්කිය වේ.

**39.** වෙළඳ ගමන්වලදී මුහම්මද් (සල්) තුමාණන්ගේ දැකගත හැකිවූ යහ ගුණාංග කදීජා මාතාවට කියූ සේවකයා වන්නේ,
(1) අන්දරා ය. (2) මයිසරා ය. (3) සන්ෆරා ය. (4) තරබා ය. (5) හන්ළලා ය.

**40.** ඉබ්නු කල්දූන්තුමා විසින් රචිත ඉතිහාස ක්ෂේත්‍රයේ ග්‍රන්ථය වන්නේ,
(1) තාරික් දිමිෂ්ක් ය. (2) අස්සීරා වත්තාරීක් ය.
(3) අල්-මුකද්දිමා ය. (4) තාරීක් තබරි ය.
(5) අල්-බිදායා වන්නිහායා ය.

41. බුවෙයිහිද් කුඩා රාජ්‍ය පාලකයා අහ්මද් බුවෙයිහි නමැත්තාට 'මුඉස්සුද් දව්ලා' යන විශේෂ ගරු නාමය ලබාදීමට හේතුව වන්නේ,
(1) ෆාතිමියිය කුඩා රාජ්‍යයට විරුද්ධව යුද වැදීමයි.
(2) තුර්කි හමුදාව මැඩ පැවැත්වීමයි.
(3) පර්සියානු හමුදාව මැඩ පැවැත්වීමයි.
(4) කොන්ස්තන්තිනෝපල් ජයග්‍රහණය කිරීමයි.
(5) බෙතුල් මුකද්දස් ජයග්‍රහණය කිරීමයි.

42. "ඔහු ඔබට වස්ත්‍රය වේ. ඔබ ඔවුන්ට වස්ත්‍රය වී සිටියි" යන අල් කුර්ආන් වැකියේ ඇති මකාසිද් ෂරීආව පිළිබිඹු කරන අදහස වන්නේ,
(1) දෙමව්පියන් හා දරුවන් අතර ආත්මීය සබඳතාවයයි.
(2) ස්වාමි පුරුෂයා හා භාර්යාව එක ම ආකාරයට ඇඳුම් ඇඳීමයි.
(3) ස්වාමි පුරුෂයා හා භාර්යාව ආගම් තේරීමේ නිදහස සහිතව ජීවත් වීමයි.
(4) ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර ආත්මීය සබඳතාවයයි.
(5) ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර දේපළවලට සමාන පංගු ඇත යන්නයි.

43. උමයියා රාජ්‍යය බිඳ වැටුනු විට එය නැවත බිහිවූ ප්‍රදේශය වන්නේ,
(1) මදීනා ය. (2) නජ්ද් ය. (3) ස්පාඤ්ඤයයි. (4) සිරියාව ය. (5) හලරමව්ත් ය.

44. විජයබාහු රජුගේ පාලන කටයුතුවල විශ්වාසදායීව කටයුතු කළ මුස්ලිම් ප්‍රධානියකු වනුයේ,
(1) සුල්තාන් ජමාල්දීන් ය. (2) ෂේක් ආලිම් ය. (3) උදුමාන් ලෙබ්බේ ය.
(4) මීරාලෙබ්බේ මෙස්දියා ය. (5) පෙරියතම්බි මරික්කාර් ය.

45. "මත්බව ඇති කරන සියල්ල ඉස්ලාම්හි තහනම් කර ඇත. ඒ අනුව වර්තමානයේ භාවිතයේ ඇති ස්වරූපය වෙනස් වූ මත්ද්‍රව්‍ය නිෂ්පාදන සියල්ල තහනම් කරන ලද ඒවා ය." ෂරීආ හි, මෙම තීරණය පහත සඳහන් කුමන වර්ගයට අයත් ද?
(1) කියාසුල් මුසාවි (2) කියාසුල් අද්නා (3) ඉජ්මාඋ මුරක්කබ්
(4) ඉජ්මාඋ සුකූති (5) උර්ෆ් කාස්

- **46** සිට **50** දක්වා සෑම ප්‍රශ්නයක ම ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එම යුගල ගැන වඩාත් ගැළපෙන සබඳතාවය පෙන්නුම් කරන නිවැරදි පිළිතුර පහත වගුවෙහි අංක (1), (2), (3), (4), (5) ඇසුරෙන් තෝරන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 46. | තාබිඋන්වරුන්ගේ සමයේ විද්වතුන් හදීස් එකලස් කොට ආරක්ෂා කිරීමේ ක්‍රියාවට ප්‍රධාන ක්‍රම හඳුන්වා දුන්නේ ය. | මුස්නද් අහ්මද් යන හදීස් ග්‍රන්ථය තාබිඋන් සමයේ සම්පාදනය කරන ලදී. |
| 47. | මුඃතසිලාවරු තාර්කිකව සහ දාර්ශනික පදනමින් දේව සංකල්පය අර්ථ දැක්වූ අය වේ. | උමයියා පාලක මෑමූන්ගේ සමයේ මුඃතසිලා සංකල්පයට රාජ්‍යය අනුග්‍රහය ලැබී ය. |
| 48. | සිද්ධාන්ත යන සංස්කෘත තාරකා ශාස්ත්‍ර ග්‍රන්ථය අල් බසාරි නමැත්තා විසින් අරාබි බසට පරිවර්තනය කරන ලදී. | මෝගල් පාලන සමයේ ඉන්දීය මුස්ලිම්වරුන් තාරකා ශාස්ත්‍රයට ඉටුකළ සේවාව පිළිබඳ සාක්ෂි දක්නට ඇත. |
| 49. | ලන්දේසීන් ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් සමග විරුද්ධතාවක් තිබූ නිසා තමාට අවශ්‍ය සේවාවන් ලබාගැනීමට ඉන්දුනීසියාවේ සිට මැලේවරුන් ගෙනෙන ලදී. | පෘතුගීසීන් හා ලන්දේසීන් විසින් ප්‍රතික්ෂේප කරන ලද ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් උඩරට රජුගේ සහය ලබාගත්තේ ය. |
| 50. | මතු ලොව ජීවිතයේ එකිනෙක මිනිසා තනි තනිව ම විභාග කරනු ලැබේ. | එකිනෙක මිනිසා තම දෙවියන්, ආත්මය, පවුල සහ සමාජය සම්බන්ධ කරුණු ගැන විභාග කරනු ඇත. |

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ඉස්ලාම් ශිෂ්ටාචාරය II
இஸ்லாமிய நாகரிகம் II
Islamic Civilization II

47 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

✳ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) නබි (සල්) තුමාට පළමු වහි පහළ කළ සිද්ධිය හා සම්බන්ධ වන කරුණු **හතරක්** පැහැදිලි කරන්න.
   (ii) අබූ බක්ර් සිද්දීක් (රළි) තුමා කිලාෆතය භාරගත් පසු, ඉස්ලාමය ආරක්ෂා කිරීමට ගත් ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න.
   (iii) කලීෆා උමර් (රළි) තුමා ඉටුකළ පරිපාලන ව්‍යුහයේ ගුණාංග **හතරක්** පැහැදිලි කරන්න.
   (iv) කලීෆා මුආවියා (රළි) තුමා උමයියා කිලාෆතය ස්ථිර කිරීමට ගත් ක්‍රියාමාර්ග **හතරක්** පැහැදිලි කරන්න.
   (v) කලීෆා වලීද් බින් අබ්දුල් මලික් තුමා රාජ්‍ය ප්‍රසාරණය සඳහා සිදු කරන ලද දායකත්ව **හතරක්** සඳහන් කොට, විස්තර කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

2. (i) මුහම්මද් (සල්) තුමා නබිත්වයට පෙර ඉටු කළ ආදර්ශවත් ක්‍රියාකලාප පැහැදිලි කරන්න.
   (ii) ඉස්ලාම් ශිෂ්ටාචාරයේ වර්ධනයට සුන්නාවල මගපෙන්වීම් **හතරක්** සඳහන් කරන්න.
   (iii) අල්-කුර්ආන් සම්පාදනය කිරීමේ තුන්වන අදියරේ කටයුතු **හතරක්** සඳහන් කොට, විස්තර කරන්න.
   (iv) ඉජ්තිහාද් පදනම මත බිහි වූ උපමූලාශ්‍ර ලැයිස්තුගත කරන්න.
   (v) දේව නීතියේ විශේෂ ලක්ෂණ **හතරක්** පැහැදිලි කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

3. (i) මුස්ලිම්වරුන් භූගෝල විද්‍යා ක්ෂේත්‍රයේ සංවර්ධනයට දායකවීමට හේතු වූ කරුණු **හතරක්** සඳහන් කොට, විස්තර කරන්න.
   (ii) මුල්කාලීන මුස්ලිම්වරුන් අතර භාෂා පරිවර්තන ක්ෂේත්‍රය සංවර්ධනයවීමට හේතු වූ සාධක **හතරක්** පැහැදිලි කරන්න.
   (iii) මුල්කාලීන මුස්ලිම්වරුන් ශ්‍රී ලංකාවේ වෙරළාසන්න ප්‍රදේශවල ජනාවාස වී ජීවත්වීමට හේතු වූ කරුණු **හතරක්** විස්තර කරන්න.
   (iv) ඉස්ලාමයේ ස්ත්‍රීන්ගේ හිමිකම් පිළිබඳ මතයන් **හතරක්** සඳහන් කොට, විස්තර කරන්න.
   (v) මිනිසකු තම දෙවිඳුන් සමග ඇති සබඳතාවය ශක්තිමත් කරගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග **හතරක්** විග්‍රහ කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

[දෙවැනි පිටුව බලන්න.

## II කොටස

**4.** (i) ආදර්ශවත් සමාජයක් ගොඩනැගීමට මස්ජිදුන් නබවි ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

(ii) හදීස් තනි කලාවක් වශයෙන් සංවර්ධනයවීමට තුඩුදුන් කරුණු පැහැදිලි කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

**5.** (i) ඉස්ලාම් ශිෂ්ටාචාරය ලොවට හඳුන්වා දුන් ආදර්ශ පැහැදිලි කරන්න.

(ii) මකාසිද් ෂරීආ හි ප්‍රධාන මානයන් උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

**6.** (i) ඉස්ලාමික දේශපාලනයේ කිලාෆතුර් රාෂිදා දැරූ විශේෂාංග විවරණය කරන්න.

(ii) විසිවන ශතවර්ෂයේ ඉන්දීය මහාද්වීපයේ ප්‍රතිසංස්කරණවාදී කටයුතු කළ මුජද්දිද්වරුන් අතුරෙන් එක් අයකු පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

**7.** (i) ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනය කිරීමට අරාබි වෙළඳ සබඳතාවය සිදු කළ බලපෑම විග්‍රහ කරන්න.

(ii) ශ්‍රී ලංකා මුස්ලිම්වරුන් සිංහල රජවරුන් හා පැවති යහසබඳතාවය ඓතිහාසික මූලාශ්‍ර මගින් ගෙනහැර දක්වන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

**8.** (i) අබ්බාසි පාලනය බිඳවැටීමට තුඩුදුන් කරුණු විග්‍රහ කරන්න.

(ii) අකබා සම්මුතිය ඇති කළ ධනාත්මක බලපෑම් පැහැදිලි කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.


# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024


# 47 - ඉස්ලාම් ශිෂ්ටාචාරය

### ලකුණු දීමේ පටිපාටිය

Alexandria University - Egypt



Jamia Millia Islamia - Delhi, India



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024

## 47 - ඉස්ලාම් ශිෂ්ටාචාරය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

මෙම විෂයයේ දෙවන ප්‍රශ්න පත්‍රයේ කොටස් දෙකක් තිබේ. එයින් I කොටසෙන් ප්‍රශ්න 02 ක් ද, II කොටසෙන් ප්‍රශ්න 03 ක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට උත්තර සපයා දිය යුතුය.

| ලකුණු බෙදී යන ආකාරය | |
|---|---|
| **I පත්‍රය** | 50 x 02 =100 |
| **II පත්‍රය**<br>I කොටස<br>II කොටස | <br>02 x 20 = 40<br>03 x 20 =60 |

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ...............................................
...............................................
............................................... √ △ $\frac{4}{5}$

(ii) ...............................................
...............................................
............................................... √ △ $\frac{3}{5}$

(iii) ...............................................
...............................................
............................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024

විෂයය අංකය / பாட இலக்கம்: **47**

විෂයය / பாடம்: **ඉස්ලාම් ශිෂ්ටාචාරය**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 2 | 21. | 4 | 31. | 3 | 41. | 2 |
| 02. | 1 | 12. | 1 | 22. | 1 | 32. | 4 | 42. | 4 |
| 03. | 4 | 13. | 3 | 23. | 2 | 33. | 1 | 43. | 3 |
| 04. | 5 | 14. | 3 | 24. | 4 | 34. | 2 | 44. | 5 |
| 05. | 2 | 15. | 4 | 25. | 3 | 35. | 3 | 45. | 2 |
| 06. | 4 | 16. | 2 | 26. | 5 | 36. | 5 | 46. | 3 |
| 07. | 1 | 17. | 3 | 27. | 4 | 37. | 4 | 47. | 3 |
| 08. | 4 | 18. | 1 | 28. | 1 | 38. | 1 | 48. | 1 |
| 09. | 5 | 19. | 5 | 29. | 4 | 39. | 2 | 49. | 1 |
| 10. | 3 | 20. | 1 | 30. | 3 | 40 | 3 | 50 | 5 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 01 × 50 = 50

## I කොටස

**1. (i) නබි (සල්) තුමාට පළමු වහි පහළ කළ සිද්ධිය හා සම්බන්ධ වන කරුණු හතරක් පැහැදිලි කරන්න.**

- හිරා හි නබිතුමාගේ හුදකලාව.
- ජිබ්රීල් (අලෛයිහි වසල්ලම්) තුමාගේ පැමිණීම
- ජිබ්රීල් (අලෛයිහි වසල්ලම්) නබි තුමා ව එය තුන් වරක් පාරායනය කරන ලෙස නබිතුමාට පැවසූහ.
- නබිතුමා බිය විය ඔහු පාරායනය කිරීමට නොදන්නා බව පැවසීය.
- කදීජා තුමිය ලගට ගොස් සිදුවීම් විස්තර කළේය.
- නබිතුමාව වරකා බින් නව්ෆල් වෙත රැගෙන යාමෙන් නබිත්වය තහවුරු කිරීම.

*(එවැනි අවස්ථා 4ක් පැහැදිලි කළහොත් ලකුණු 4x1= 04)*

**(ii) අබූ බක්ර් සිද්දීක් (රළි) තුමා කිලාෆතය භාරගත් පසු, ඉස්ලාමය ආරක්ෂා කිරීමට ගත් ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න.**

- මුර්තද්වරුන් පිළිබඳ ගැටලුව විසඳීමට උත්සාහ කළේය.
- සකාත් ගෙවීම ප්‍රතික්ෂේප කරන්නන් සකාත් ගෙවීමට එකඟ කරවීම.
- දක්ෂ ජෙනරාල්වරුන් යැවීමෙන් දේශසීමාව සුරක්ෂිත කිරීම.
- දේශසීමා පාලකයින් විසින් ඉස්ලාමීය කිලාෆතයට එරෙහි තර්ජන පරාජය කිරීම. විශේෂයෙන්ම සිරියාව පර්සියානු (උසාමා (රළි) තුමාණන්ගේ නායකත්වය යටතේ ෂාම් (සිරියාව) වෙත හමුදාවක් යැවීය.
- බොරු වක්තෘවරුන්ට එරෙහිව පියවර ගැනීම.
- අල්කුරානය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.

*(එවැනි ක්‍රියාකාරකම් 4ක් ලියා ඇත්නම් ලකුණු 4x1= 04)*

**(iii) කලීෆා උමර් (රළි) තුමා ඉටුකළ පරිපාලන ව්‍යුහයේ ගුණාංග හතරක් පැහැදිලි කරන්න.**

- පළාත් පාලන පද්ධතිය
- මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ හෝ බයිතුල් මාල් ප්‍රතිසංස්කරණ
- අධිකරණ ප්‍රතිසංස්කරණ
- උපදේශක සභාව පිහිටුවීම
- හමුදා ප්‍රතිසංස්කරණ
- ආර්ථික ප්‍රතිසංස්කරණ (කෘෂිකර්මාන්තය, වාරිමාර්ග, ප්‍රවාහනය ආදිය)
- දීවාන් හඳුන්වාදීම (දීවාන් බරීද්, දීවානුල් ජුන්ද්..)
- අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ
- පොදු සේවා
- හිජ්රි දින දර්ශනය හඳුන්වාදීම

*(එවැනි ව්‍යුහයන් 4ක් පැහැදිලි කළ ඇත්නම් ලකුණු 4x1= 04 )*

**(iv) කලීෆා මුආවියා (රලි) තුමා උමයියා කිලාෆතය ස්ථිර කිරීමට ගත් ක්‍රියාමාර්ග හතරක් පැහැදිලි කරන්න.**

- දමස්කස් අගනුවර කිරීම.
- පරිපාලනය මස්ජිදයෙන් මාලිගාවට ගෙනයෑම.
- සතුරන් පවා තමාට පක්ෂව හරවා ගැනීම. (සියාද් බින් අබිහ්)
- කිලාෆතයේ හමුදාව බලයට ගැළපෙන එකක් බවට ප්‍රතිසන්ධානය කිරීම.
- විවිධ සංවර්ධන මුලපිරීම්වලට සම්බන්ධ වීම.
- රට තුළ සාමය සහ සමාදානය ඇති කිරීමට පියවර ගැනීම.
- ඉස්ලාමීය අධිරාජ්‍යයේ ව්‍යාප්ත කිරීම
- ෂාම් වැසියන්ගේ සහයෝගය ලබා ගැනීම.
- ඔහුගේ අනුප්‍රාප්තිකයා මීළඟ කලීෆාවරයා ලෙස පත් කිරීම.

*(එවැනි කරුණු 4ක් පැහැදිලි කළහොත් ලකුණු 4x1=04)*

**(v) කලීෆා වලීද් බින් අබ්දුල් මලික් තුමා රාජ්‍ය ප්‍රසාරණය සඳහා සිදු කරන ලද දායකත්ව හතරක් සඳහන් කොට, විස්තර කරන්න.**

කලීෆා වලිඩ්ගේ පාලන සමයේදී ඉස්ලාමීය කිලාෆත්හි විශාල කොටසක් අත්පත් කර ගන්නා ලදී. ඒ අනුව

- මූසා බින් නුසයිර් - උතුරු අප්‍රිකාව
- තාරික් බින් සියාද් - ස්පාඤ්ඤය
- මුහම්මද් බින් කාසිම් - සින්ද්
- කුදයිෆා බින් මුස්ලිම් - මධ්‍යම ආසියාව පාලනය කළේය.
- මස්ලමා - කැස්පියන් මුහුදු කලාපය යටපත් කර ගැනීම
- උමර් ඉබ්නු අබ්දුල් අසීස් විසින් මදීනාවේ යහපාලනය ස්ථාපිත කිරීම.
- විශිෂ්ට ප්‍රාදේශීය හමුදාපතිවරුන්ගේ සහයෝගය ලබා ගැනීම. (හජ්ජාජ් බින් යූසුෆ්, මූසා බින් නුසයිර්)

*(මෙම දායකත්වයන් හතරක් සඳහන් කර පැහැදිලි කළහොත් ලකුණු 4x1=04)*

*(4x5= ලකුණු 20)*

**2. (i) මුහම්මද් (සල්) තුමා නබිත්වයට පෙර ඉටු කළ ආදර්ශවත් ක්‍රියාකලාප පැහැදිලි කරන්න.**

- තරුණ වියේදී කුරේෂි සමග සමාජ සුබසාධන කටයුතුවලට සම්බන්ධ වී ඇත (හර්බුල් ෆූජ්ජාර්)
- හිල්ෆුල් ෆුලූල් සංවිධානය සමග සහයෝගීතාවය.
- ඔහුගේ වෘත්තිය ලෙස එළු පාලනයේ නිරත වීම.
- සාධාරණ වෙළඳාමේ නිරත වේ.
- හජරුල් අස්වත් ගල නියමිත ස්ථානයේ තැබීමට බේරුම්කරුවෙකු ලෙස කටයුතු කිරීම.
- අන් අයට උපකාර කිරීම. (ඇපකර සංරක්ෂණය)
- අවංක සහ විශ්වාසනීය භාවිතයන් තුළ ආදර්ශවත් හැසිරීම.

*(නබිතුමාගේ මෙම ආදර්ශමත් ක්‍රියාවන් හතර පැහැදිලි කර ඇත්නම් 4x1=04 කරුණු)*

**(ii) ඉස්ලාමීය ශිෂ්ටාචාරයේ වර්ධනයට සුන්නාවල මගපෙන්වීම් හතරක් සඳහන් කරන්න.**

- තනි පුද්ගල
- පවුල
- සමාජය
- දේශපාලනය
- ආර්ථික විද්‍යාව
- සෞන්දර්යය
- විද්‍යාව වැනි ක්ෂේත්‍රවලට මඟ පෙන්වයි.

***(මෙම මාර්ගෝපදේශ හතරක් සඳහන් කරන්නේ නම් ලකුණු 4x1=04 )***

**(iii) අල්-කුර්ආන් සම්පාදනය කිරීමේ තුන්වන අදියරේ කටයුතු හතරක් සඳහන් කොට, විස්තර කරන්න.**

- ආර්මේනියානු - අසර්බයිජානි යුද සමයේදී අල්කුර්ආනය පාරායනය කරන ආකාරයෙහි වෙනස දුටු හුදෙයිෆතුල් යමානි (රළි) විසින් උස්මාන් (රළි) වෙත ආයාචනය කිරීම.
- උච්චාරණයේ ඒකාකාරී බව තහවුරු කිරීම සඳහා කමිටුවක් පත් කිරීම.
    - සෙයිද් බින් සාබිත් (සභාපති)
    - අබ්දුල්ලා ඉබ්නු සුබෙයිර්
    - සයීඩ් බින් ආස්
    - අබ්දුර් රහ්මාන් අල් හාරිත් (රළි)
- හෆ්සා (රළි) විසින් සංරක්ෂණය කරන ලද මුස්හෆ් පිටපත් හතක් සකස් කරන ලදී.
- එය අධිරාජ්‍යයේ බොහෝ ප්‍රදේශවලට (මක්කා, මදීනා, කූෆා, බසරා, දමස්කස්, ඕමාන්, බහරේන්) එහි පාඨකයන් සමග යවන ලදී.
- කලින් ලියා ඇති සියලුම පිටපත් මකා දැමීම.
- කුරෙයිෂිවරුන්ගේ මුරත්තල් ක්‍රමයට ඒකාබද්ධ වීම.

***(මෙවැනි කරුණු 4ක් පැහැදිලි කළ ඇත්නම් ලකුණු 4x1=04)***

**(iv) ඉජ්තිහාද් පදනම මත බිහි වූ උපමූලාශ්‍ර ලැයිස්තුගත කරන්න.**

- ඉජ්මා
- කියාස්
- මස්ලහා මුර්සලා
- ඉස්තිහ්සාන්
- ඉස්තිස්හාබ්
- උර්ෆු
- කෞලුස් සහාබි
- අමලු අහ්ලුල් මදීනා
- සද්දු දරායි

***(මෙම ද්විතියික මූලාශ්‍ර 8ක් සඳහන් වන්නේ නම් 1/2x8=04)***

**(v) දේව නීතියේ විශේෂ ලක්ෂණ හතරක් පැහැදිලි කරන්න.**

- දිව්‍යමය ස්වභාවය (රබ්බානියියා)
- පරිපූර්ණත්වය (ශුමූලියියාහ්)
- විශ්වීයත්වය (උමූමියියා)
- යථාර්ථවාදී (වාකිඉයියා)
- ධර්මිෂ්ඨ (අල්අද්ල්)
- ජාත්‍යන්තරකරණය (ආලමියියා)
- මධ්‍යස්ථ (වාසතියියා)
- සැහැල්ලු
- නම්‍යශීලීත්වය හා නම්‍යශීලී නොවන
- දුෂ්කරතා ජය ගත හැක
- මානව සුභසාධන ඉලක්ක කර ඇත
- සංස්කෘතීන් ආරක්ෂා කිරීම

***(එවැනි ලක්ෂණ 4ක් පැහැදිලි කළහොත් 4x1= 04)***

**3. (i) මුස්ලිම්වරුන් භූගෝල විද්‍යා ක්ෂේත්‍රයේ සංවර්ධනයට දායකවීමට හේතු වූ කරුණු හතරක් සඳහන් කොට, විස්තර කරන්න.**

- අරාබිවරුන් නාවිකයන් වූ අතර විදේශ වෙළඳ කටයුතුවල නිරත වීම
- ඉස්ලාමයට පෙර සිට, අරාබිවරුන් බොහෝ රටවල් සමග මුහුදු සහ ගොඩබිම් යන දෙඅංශයෙන්ම වාණිජ සබඳතා පැවැත්වූහ.
- රටවල් භෞතික පරිසරය සහ මානව සමාජ පිළිබඳ දැනුම ලබා ගැනීම.
- ඉස්ලාම් ආගමේ බිහිවීමෙන් පසු අල් කුර්ආන් සුන්නාහ් පොළඹවීම. (ගමන් කරන්න, ඔබ නිරෝගී වනු ඇත - හදීස්)
- ඉස්ලාමීය ඉබාදා (වත්පිළිවෙත්).
- භූගෝලය පිළිබඳ වෙනත් භාෂා පොත් අරාබි භාෂාවට පරිවර්තනය කිරීම.
- ඉස්ලාමීය අධිරාජ්‍යයේ ව්‍යාප්තිය.
- විද්‍යාව පිළිබඳ උනන්දුව

***(මෙම සාධක හතරක් පැහැදිලි කළහොත් ලකුණු 4x1= 04)***

**(ii) මුල්කාලීන මුස්ලිම්වරුන් අතර භාෂා පරිවර්තන ක්ෂේත්‍රය සංවර්ධනයවීමට හේතු වූ සාධක හතරක් පැහැදිලි කරන්න.**

- බුද්ධිමය පර්යේෂණ සඳහා ඉස්ලාමයේ දිරිගැන්වීම
- වෙනත් භාෂා ඉගෙන ගැනීමට නබිතුමාගේ දිරිගැන්වීම (සයිද් ඉබ්නු තාබිත්).
- වෙනත් භාෂා දැනුම සම්ප්‍රදායන් අවබෝධ කර ගැනීම සඳහා පරිවර්තන කටයුතුවල නිරත වීම.
- වෙනත් භාෂාවලින් හමුවන විද්‍යාත්මක දෝෂ පිළිබඳ නිර්මාණාත්මක විවේචන.
- ග්‍රීක, පර්සියානු සහ ඉන්දියානු ග්‍රන්ථවල ඇති බුද්ධිමය දත්ත ලබා ගැනීමට ඇති උනන්දුව.
- ශිෂ්ටාචාරයේ ලක්ෂණයක් ලෙස දැනුම වර්ධනය කිරීමට ඇති උනන්දුව සහ කැපවීම.
- පාලකයන් විසින් දෙන ලද දිරිගැන්වීම්.

***(එවැනි සාධක 4ක් පැහැදිලි කළහොත් ලකුණු 4x1= 04)***

(iii) මුල්කාලීන මුස්ලිම්වරුන් ශ්‍රී ලංකාවේ වෙරළාසන්න ප්‍රදේශවල ජනාවාස වී ජීවත්වීමට හේතු වූ කරුණු **හතරක්** විස්තර කරන්න.

- වෙළඳාම සඳහා සුදුසු වරායන් තිබීම.
- නැව් නැංගුරම් ලා අලුත්වැඩියා කිරීමේ හැකියාව.
- ජලය සහ ප්‍රනීත ආහාර තිබීම.
- වෙරළ තීරයේ ඇති වටිනා භාණ්ඩ.
- ශ්‍රී ලංකාවේ පිහිටීම. (නැගෙනහිර - බටහිර වෙළඳ මාර්ගයේ පිහිටීම)
- මෝසම් සුළං වල බලපෑම.
- වරාය පාලනය අරාබිවරුන් පාලනයේ තිබීම
- වෙරළ තීරයේ ජනාවාස පැවතීම.

*(මෙම සාධක හතරක් පැහැදිලි කළහොත් ලකුණු **4x1= 04**)*

(iv) ඉස්ලාමයේ ස්ත්‍රීන්ගේ හිමිකම් පිළිබඳ මතයන් **හතරක්** සඳහන් කොට, විස්තර කරන්න.

- ජීවත්වීමේ අයිතිය
- දේපල හිමිකම් සඳහා ඇති අයිතිය
- ව්‍යවසායකත්වය සඳහා ඇති අයිතිය
- විවාහය - දික්කසාද වීමට ඇති අයිතිය
- අධ්‍යාපනයට ඇති අයිතිය
- සමානාත්මතාවය යුක්තියට ප්‍රවේශ වීමේ අයිතියයි.

*(මෙම සාධක හතරක් පැහැදිලි කළහොත් ලකුණු **4x1= 04**)*

(v) මිනිසකු තම දෙවිඳුන් සමග ඇති සබඳතාවය ශක්තිමත් කරගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග **හතරක්** විග්‍රහ කරන්න.

- ඊමාන්
- තව්බා
- දික්ර්
- යාච්ඤාවල නිරත වීම
- කුරාන් දිලාවත්
- යාඥාව, උපවාසය සහ හජ් වැනි නමස්කාර ක්‍රියාවන්හි නිරත වීම
- දන් දීම
- ඉහ්ලාස්

*(මෙවැනි ක්‍රියාකාරකම් 4ක් පැහැදිලි කළහොත් ලකුණු **4x1= 04**)*

## II කොටස

**4. (i) ආදර්ශවත් සමාජයක් ගොඩනැගීමට මස්ජිදුන් නබවී ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.**

හැඳින්වීම

ආදර්ශමත් සමාජයක් බිහිකිරීමේ අරමුණින් නබි (සල්) තුමාණන්ගේ මදීනාවට සංක්‍රමණය වීමේ පළමු කාර්යය ලෙස මස්ජිද් නබවි ඉදිකරන ලදී.

- ආගමික කටයුතු සිදු කිරීම.
    - ජමාත් යාච්ඤාව
    - ජුමුආ යාච්ඤාව
    - කුර්ආනය පාරායනය කිරීම
    - ඉඃතිකාෆ්

- ප්‍රජා වැඩ සිදු කිරීම.
    - සහෝදරත්වය සහ සමගිය
    - ප්‍රජාවන් අතර සමගිය ගොඩනැගීම
    - අවදානමට ලක්විය හැකි පුද්ගලයින් රැකබලා ගැනීම සඳහා විධිවිධාන
    - වෛද්‍යය පහසුකම් සැපයීම.
    - සමාජ ආරක්ෂණ පියවර (බද්ර් උහද්)
    - සමාජ ආරක්ෂාව සහතික කිරීම සඳහා දඬුවම් ක්‍රියාත්මක කිරීම.

- දේශපාලන කටයුතු සිදු කිරීම.
    - මදීනා ප්‍රඥප්තිය
    - අනෙකුත් සමාජ ගෝත්‍ර සමග ගිවිසුම්
    - රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වාගෙන යාම
    - අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

- අධ්‍යාපනික කටයුතු
    - හිෆ්ලුල් අල්කුර්ආන්
    - හදීස් ඉගැන්වීම
    - අස්හාබුස් සුෆ්ෆාවරුන් අධ්‍යාපනික වශයෙන් අනුශාසනා කිරීම
    - කුත්තාබුල් වහි
    - සිරකරුවන් විසින් සිදු කරන ලද ඉගන්වීම් කටයුතු

- ආර්ථිකය
    - ඉස්ලාමීය ආර්ථික මූලධර්මවල මූලික කරුණු හඳුන්වා දීම
    - සකාත් එකතු කිරීම සහ බෙදා හැරීම
    - නව වෙළඳපල අවස්ථා නිර්මාණය කිරීම
    - මස්ජිදුන් නබවි අවට වෙළෙඳපොළ

**(හැඳින්වීම - 02)**

**(දේශපාලන, ආර්ථික, සමාජීය, ආගමික සහ අධ්‍යාපනික මාතෘකා ආවරණය වන පරිදි විෂයයන් 8ක් ලියා ඇත්නම් - ලකුණු 08)**

***එකතුව - ලකුණු 10***

**(ii) හදීස් තනි කලාවක් වශයෙන් සංවර්ධනයවීමට තුඩුදුන් කරුණු පැහැදිලි කරන්න.**

හැඳින්වීම

- හදීස් නබි (සල්) තුමාණන්ගේ කාලයේ සිට සහාබාවරුන්ගේ කාලය දක්වා වෙනම ම කලාවක් ලෙස වර්ධනය නොවීය.
- සහාබාවරුන් අනුගමනය කරමින් තාබිඊ වරුන්ගේ කාලයේ සිට මතු වූ විවිධ හේතු හදීස් වෙනම කලාවක් ලෙස වර්ධනය වීමට ප්‍රධාන හේතු විය.
- සමහර උමයියා පාලකයන්ගේ දුර්වල තත්ත්වය
- කුලෆාවරුන් විසින් හදීස් සංරක්ෂණය කිරීමට ගත් උත්සාහයන් පසුකාලීන පාලකයන් විසින් අත්හැර දැමීම.
- සියවසක් පමණ හදීස් සම්පාදනය කර නොතිබුණි
- ව්‍යාජ හදීස් වල මූලාරම්භය
- තාර්කික විසඳුම් සැපයීමට ඇති කැමැත්ත.
- සහාබාවරුන් දුර පළාත්වලට සංක්‍රමණය විය.
- හදීස් දැන සිටි සහබාවරුන්ගේ මරණය.
- සත්‍ය හදීස් සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාවය.
- කලීෆා උමාර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්) හදීස් ක්ෂේත්‍රයේ ඉමාම් සුහ්රිගේ නායකත්වය යටතේ හදීස් එකතු කිරීමට පියවර ගත්තේය.
- හදීස් කලාවේ වර්ධනයේ ඉහළම අදියර වූයේ හදීස් ග්‍රන්ථ, හදීස් විශ්ලේෂණ කලාව සහ ඉල්මුල් හදීස් සංවර්ධනයයි.

*හැඳින්වීම - ලකුණු 02*

*(එවැනි කරුණු 4ක් ලියා පැහැදිලි කරන්නේ නම් 4x2 = 08)*

*(මුළු ලකුණු 10)*

**5. (i) ඉස්ලාම් ශිෂ්ටාචාරය ලොවට හඳුන්වා දුන් ආදර්ශ පැහැදිලි කරන්න.**

ඉස්ලාමීය ශිෂ්ටාචාරය බිහිවන්නේ ඒකදේවවාදය හඳුන්වා දීමෙනි. ඉස්ලාමීය ශිෂ්ටාචාරය ලෝකයේ පවතින සංස්කෘතික ශිෂ්ටාචාරවලට වඩා වෙනස් ය.

- තව්හීද්, රිසාලාත්, මආද් මත පදනම් වූ මූලධර්ම ඉදිරිපත් කිරීම.
- පුද්ගල, පවුල, ප්‍රජාව, ජාතික සහ ජාත්‍යන්තර මාර්ගෝපදේශ ඉදිරිපත් කිරීම.
- අධ්‍යාත්මික - ලෞකික මග පෙන්වීම.
- මධ්‍යස්ථ චින්තනයක් ලබා දීම.
- මානව සුභසාධනය ආරක්ෂා කිරීම මත පදනම් වීම.
- විද්‍යාත්මක පර්යේෂණ සඳහා මාර්ගෝපදේශය ලබා දීම.
- කාලය, ස්ථානය සහ පරිසරයට අදාළ උපදෙස් ලබා දීම.
- කුල හා වාර්ගික භේදයකින් තොරව සමානාත්මතාවය
- නම්‍යශීලී - නම්‍යශීලී නොවන ගුණ සහිත රාමු සමගාමීව අන්තර්ගත වීම.

හැඳින්වීම - ලකුණු 02

*(එවැනි පූර්වාදර්ශ 8ක් පැහැදිලි කරන්නේ නම් 8 X1 = 08 )*

*(මුළු ලකුණු 10)*

(ii) මකාසිද් ෂරීආ හි ප්‍රධාන මානයන් උදාහරණ සහිතව විස්තර කරන්න.

හැඳින්වීම

ඉස්ලාමීය ෂරියයාහි අරමුණු යනු ඉස්ලාමීය නීතිවල ඉලක්කය හෝ අරමුණ හෝ සාක්ෂාත් කර ගැනීම හෝ අපේක්ෂාව ලෙස සැලකේ.

- ළරූරියියාත් - අත්‍යවශ්‍ය තත්ත්වය (අත්‍යවශ්‍ය අවශ්‍යතා)
- හාජියියාත් - අවශ්‍යතා මට්ටම (සාමාන්‍ය අවශ්‍යතා)
- තහ්සීනියියාත් - සුඛෝපභෝගී තත්ත්වය (උසස් අවශ්‍යතා)

**අත්‍යවශ්‍ය තත්වය - ළරූරියියාත්**

- එය මිනිස් ජීවිතයේ අත්‍යවශ්‍ය අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමට මග පාදයි.
- ඉමාම්වරු සාමාන්‍යයෙන් එය පහත ආකාරයට බෙදති

1. දීන් සංරක්ෂණය කිරීම - හිෆ්ලුද්දීන්
2. ජීවිත ජීවිතය ආරක්ෂා කිරීම - හිෆ්ලුන් නෆ්ස්
3. බුද්ධිය සංරක්ෂණය - හිෆ්ලුල් අක්ල්
4. උරුමය සංරක්ෂණය කිරීම - හිෆ්ලුන් නසබ්
5. ගෞරවය රැකගැනීම - හිෆ්ලුල් ඉර්ල්
6. ධනය සංරක්ෂණය - හිෆ්ලුල් මාල්

**සාමාන්‍ය අවශ්‍යතා - හාජියියාත්**

- මිනිසුන්ට ඇති වන දුෂ්කරතා සහ අපහසුතාවයන් ඉවත් කිරීම හාජියියාත් වේ. උදාහරණ වශයෙන්
- රෝගීන් සහ වන්දනාකරුවන් රාමසාන් උපවාසයෙන් නිදහස් කර පසුව එය සම්පූර්ණ කිරීමට වරප්‍රසාද ලබා දේ.
- මගීහු රකුඅත් 4ක් සහිත සලාතය දෙකකින් ඉටු කිරීමට අවස්ථාව ලබා දීම
- ජලය නොමැති විට තයම්මුම් කිරීමට අවස්ථාව ලබා දීම.

**තහ්සීනියියාත් - සුඛෝපභෝගී තත්ත්වය**

- මෙය ළරූරියියාත් සහ හාජියියාත් වලට වඩා ගුණාත්මක භාවයෙන් පහත් වේ. උදාහරණ වශයෙන්
- සිකුරාදා දිනවල සුදු ඇඳුම පැළඳීම
- අලුත් අවුරුදු කාලයේ සහ විශේෂ අවස්ථා වලදී සුවඳ විලවුන් භාවිතා කිරීම

*(හැඳින්වීම - 01)*
*(උදාහරණ සමග කොටස් තුනම පැහැදිලි කරන්නේ නම් 3 x 3 = 09 )*
*(මුළු ලකුණු 10)*

**6. (i) ඉස්ලාමීය දේශපාලනයේ කිලාෆතුර් රාෂිදා දැරූ විශේෂාංග විවරණය කරන්න.**

හැඳින්වීම

කිලාෆතු රාෂිදා හැඳින්වීම

- රජයේ ව්‍යවස්ථාව ලෙස අල් කුර්ආනය සහ සුන්නාහ්
- මජ්ලිෂුස් සූරා පදනම මත පාලනය.
- කැලිෆා ප්‍රජාතන්ත්‍රවාදීව ජනතාව විසින් තෝරා පත් කර ගනු ලැබේ
- පත්වීම් වලදී තක්වා සහ සුදුසුකම් වලට ප්‍රමුකස්ථානය.
- කිලාෆත් ආරම්භ වූ මදීනා නගරය අගනුවර විය.
- සමාජ සුබසාධනය අවධාරණය කිරීම.
- බයිතුල් මාල් පොදු දේපලක් ලෙස සැලකීම.
- කලිෆාවරුන් සරල ජීවන රටාවක් අනුගමනය කළහ
- පරිපාලන ක්‍රියා පටිපාටි ඉජ්තිහාද් පදනම මත සිදු කෙරේ
- පාලකයා සහ සාමාන්‍ය ජනතාව අතර සම්බන්ධය සමීප බව නිරීක්ෂණය විය.

*හැඳින්වීම - ලකුණු 02*
*(එවැනි කරුණු 8ක් පැහැදිලි කරන්නේ නම් - ලකුණු 08)*
*(මුළු ලකුණු 10)*

**(ii) විසිවන ශතවර්ෂයේ ඉන්දීය මහාද්වීපයේ ප්‍රතිසංස්කරණවාදී කටයුතු කළ මුජද්දිද්වරුන් අතුරෙන් එක් අයකු පිළිබඳ විස්තර කරන්න.**

හැඳින්වීම

20 වැනි සියවසේ ඉන්දියානු උපමහාද්වීපය පිළිබඳ හැඳින්වීම

- තරුණ කාලය හා අධ්‍යාපනය (මුල් ජීවිතය)
- සමාජ ආගමික සහ දේශපාලන පසුබිම
- ප්‍රතිසංස්කරණ කටයුතු

*(ඉහත කරුණු ආවරණය කර ඇත්නම් ලකුණු 10)*

**7. (i) ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනය කිරීමට අරාබි වෙළඳ සබඳතාවය සිදු කළ බලපෑම විග්‍රහ කරන්න.**

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගොඩනැගීම සඳහා අරාබිවරුන් විශාල දායකත්වයක් ලබාදී ඇත.

- ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රජාවට හඳුන්වා දීම.
- විදේශ විනිමය ලැබීම සහ ප්‍රේෂණය කිරීම.
- ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර ඉල්ලුම ආකර්ෂණය කර ගැනීම.
- ශ්‍රී ලංකාවේ විදේශ ආක්‍රමණයෙන් හානියට පත් වැව් සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට ආධාර.
- ශ්‍රී ලංකාවේ වරාය සංවර්ධනය වැඩිදියුණු කිරීම.
- ශ්‍රී ලංකාවේ වටිනා නිෂ්පාදන ඔවුන්ගේ පොත්වල සඳහන් කර හඳුන්වා දීම. (අල්බරූනි - කිතාබුල් ජමාහිර් ෆී මහ්රිෆතිල් ජවාහිර්)
- ව්‍යාපාර උපදේශකයින් ලෙස කටයුතු කිරීම.
- පණිවිඩකරුවන් ලෙස කටයුතු කිරීම (අබූ උස්මාන්)
- ධීවර කටයුතු හා තවලම ප්‍රවාහන පද්ධතිය (මඩිගේ පාත නිළමේ) හඳුන්වාදීම.

*(හැඳින්වීම - 02)*

*(එවැනි කරුණු 8ක් ලියා ඇත්නම් ලකුණු 08)*

(ii) ශ්‍රී ලංකා මුස්ලිම්වරුන් සිංහල රජවරුන් හා පැවති යහසබඳතාවය ඓතිහාසික මූලාශ්‍ර මගින් ගෙනහැර දක්වන්න

හැඳින්වීම

- සිංහල රජවරුන් සමග මුස්ලිම් සබඳතා පැරණිය.
- ශ්‍රී ලාංකේය මුස්ලිම්වරුන් මුල් කාලයේ සිටම සිංහල රජවරුන් සමග හොඳ සබඳතාවක් පවත්වා ඇත.
- සිංහල රජවරුන්ගේ විශ්වාසවන්තයින් වීම.
- විජයබාහු (ක්‍රි.ව. 1055-1070) රජුගේ රාජාභිෂේක උත්සවය සඳහා පෙරිය තම්බි මරික්කාර්ගේ සහයෝගය ලබා දුන් අතර ඔහුගේ ව්‍යාපාරික සම්බන්ධකයා ලෙස ක්‍රියා කළේය.
- මුස්ලිම්වරුන් ඇමතිවරුන් සහ නිලධාරීන් ලෙස ඉහළ තනතුරු දරා ඇත.
- ක්‍රි.ව 12 වැනි සියවසේ විසූ අල් ඉද්රීසි නම් විද්‍යාඥයා වාර්තා කරන්නේ මුස්ලිම් ඇමතිවරුන් හතර දෙනෙකු සිංහල රාජ්‍යට සේවය කළ බවයි.
- පරණවිතාරන History of Ceylon යන ග්‍රන්ථයේ සඳහන් වේ.
- වසන්තා මෝහන Muslim in Sri Lanka
- මුස්ලිම්වරු තානාපතිවරුන් ලෙස කටයුතු කළහ.
- ක්‍රි.ව 1283 දී ශ්‍රී ලංකා රජු විසින් ඊජිප්තුවට යවන ලද දූත පිරිසේ ප්‍රධානියා වූයේ අබු උස්මාන්ය.
- මුස්ලිම් ඔටුනු පැළඳීම තරම් මුස්ලිම්වරු සිංහල රජවරුන් සමග හොඳ සබඳතා පැවැත්වූහ.
- කුරුණෑගල යුගය - වස්තු හිමි
- පර්යේෂක එන්. ජේ කරුණාතිලක - වයඹ ලංකාවේ රාජධානි
- රාජකීය සභාවේ පිළිගැනීමේ කාර්ය මණ්ඩලය ලෙස මුස්ලිම්වරුන්.
- ඉංග්‍රීසි තානාපති ජෝන් පයිප්පස් මහනුවර රජු හමුවීමට රජු වෙනුවෙන් මුස්ලිම් නියෝජිතයෙකු විසින් පිළිගෙන සංග්‍රහ කරන ලදී.
- දෙපාර්තමේන්තුව භාරව කටයුතු කිරීම.
- කීර්ති ශ්‍රීරාජා සිංහන්හ රජුගේ කාලයේ මැඩිකේ බද්ධ නම් දෙපාර්තමේන්තුව භාරව සිටි ෂෙක් ආසීක් (ආලික්) නම් මුස්ලිම් නිලධාරියෙක් සිටියේය.
- රාජකරුණා ගෝපාල් මුදියන්සාලාගේ, රාළහාමි යන විශේෂ නාමය සහිත මුස්ලිම්, මහනුවර සිරි වික්‍රමසිංහ රජුගේ පාලන සමයේදී අගවිනිසුරු ලෙස කටයුතු කළේය.
- ලෝනා දේවරාජ්
- මායාදුන්න රජුගේ සීතාවක හමුදාව සමග පෘතුගීසීන්ට එරෙහිව ක්‍රියා කිරීම.
- මහනුවර විමලධර්මසූරිය රජුගේ පාලන සමයේදී මුහුදුබඩ ආරක්ෂාව සඳහා අණදෙන සෙන්පතියා ලෙස මුස්ලිම් ජාතිකයකු පත් කරන ලදී.
- ක්‍රිස්තු වර්ෂ 1270 දී දඹදෙණියේ සිව්වන විජයබාහු රජු ඔහුගේ හමුදාපති වූ මිත්තා විසින් ඝාතනය කරන විට තවත් සේනාංකයකට නායකත්වය දුන් තාගෝර් මිත්තා ව මරා රාජ්‍යය බේරා ගත්තේය.
- කේ. කරුණාතිලක - වයඹ ලංකාවේ රාජධානි ය

*(හැඳින්වීම - ලකුණු 02)*
*(එවැනි කරුණු 05ක් සාක්ෂි සහිතව පැහැදිලි කළහොත් ලකුණු 08)*
*(මුළු ලකුණු 10)*

**8.** (i) අබ්බාසි පාලනය බිඳවැටීමට තුඩුදුන් කරුණු විග්‍රහ කරන්න.

හැඳින්වීම

**දේශපාලන සාදක**

- අබ්බාසිවරුන්ගෙන් පසු බලයට පත් වූ කලීෆාවරුන්ගේ නොහැකියාව සහ දුර්වලකම.
- අනුප්‍රාප්තිකයා අනිසි ලෙස පත් කිරීම
- තුර්කි බලපෑම
- කුඩා රාජ්‍යයන් බිහිවීම
- හමුදාවේ අසහනකාරී තත්ත්වය
- විදේශ ආක්‍රමණය - කුරුස යුද්ධ යුදෙව් ටාටේරියානු ආක්‍රමණය

**ආගමික සාධක**

- ආගමික නිකායන් බිහිවීම.
- ඉජ්තිහාද් එකතැන පල්වීම
- ප්‍රායෝගික ජීවිතට ඉස්ලාමීය මාර්ගෝපදේශ අනුගමනය කිරීමට අපොහොසත් වීම.
- ආගමික විද්වතුන්ට හිංසා පීඩා කිරීම (අහ්මද් බින් හන්බල් (රහ්)

**සමාජ සාධක**

- ගෝත්‍රිකවාදය සහ සතුරුකම (උමයියා - හාෂිමී)
- පර්සියානුවන්ගේ බලය ශක්තිමත් විය.
- නව යොවුන් පරපුරේ සුඛෝපබෝගී උමතුව.
- පාලකයන්, පරිපාලකයින් සහ ධනවතුන්ගේ දූරාචාර ජීවිතය

**ආර්ථික සාධක**

- අරමුදල් නොමැතිකම
- නිරන්තර විදේශ ආක්‍රමණ
- සාමාන්‍ය ජනතාව ආර්ථික අර්බුදවලට ගොදුරු වීම.
- ස්වභාවික විපත්
- අසාධාරණ බදු අය කිරීම

**(දේශපාලන, ආගමික, සමාජීය සහ ආර්ථික සාධක හඳුන්වා දී පැහැදිලි කර ඇත්නම් ලකුණු 10)**

(ii) අකබා සම්මුතිය ඇති කළ ධනාත්මක බලපෑම් පැහැදිලි කරන්න.

අකබා ගිවිසුමේ පසුබිමට හඳුන්වාදීම

- නබි (සල්) තුමාණන්ගේ පූර්ණ පිළිගැනීම.
- අපරාධ නොවන ආදර්ශවත් සමාජ ගොඩනැගීමේ මූලාරම්භය.
- මදීනා හිජ්රත් හි ආරම්භය.
- ඉස්ලාමය ස්ථාවර වී ඇති අතර ඉස්ලාමයේ නැගීම සඳහා අවස්ථාව ලැබීම.
- සමාජ ආරක්ෂණය පිළිගැනීම.

***(05 x 2 =ලකුණු 10)***